(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(11).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 ඔක්තෝබර් 21 සිකුරාදා**

---

**2022 නොවැම්බර් 08 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2979/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වකුගඩු රෝගීන්ගේ රුධිර කාන්දුකරණය සඳහා මාතලේ, විල්ගමුවේ ඉදිකිරීම් ආරම්භ කරන ලද රෝහලේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) මේ වනවිට, එම ඉදිකිරීම්වලින් අවසන් කර ඇති ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත ප්‍රදේශය අවට රුධිර කාන්දුකරණය අවශ්‍ය වකුගඩු රෝගීන් 2000කට වඩා සිටින බව දන්නේද;

(iv) එම රෝගීන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා අධික වියදමක් දරමින් වෙනත් රෝහල්වලට යාමට සිදු වී ඇති බව දන්නේද:

(v) ඉහත සඳහන් රෝහලේ වැඩකටයුතු අවසන් කර, එය විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3084/2022

ගරු තිසකුට්ටි ආරච්චි මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු කොරියාවේ රැකියාවල නියුක්තව සිටින ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 05ක කාලයක් සඳහා ඔවුන්ට ලබා දී තිබෙන වීසා අවසන් වීමෙන් පසු, එම වීසා කාලය නැවත දීර්ඝ කරන්නේද;

(iii) ඔවුන් විසින් ශ්‍රී ලංකාවට වාර්ෂිකව ප්‍රේෂණය කරනු ලබන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3115/2022

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඩදාසි සහ මුද්‍රණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන තීන්ත වර්ග ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන මුළු කඩදාසි සහ මුද්‍රණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන මුළු තීන්ත වර්ග ප්‍රමාණයෙන් රාජ්‍ය අංශය විසින් භාවිතා කරනු ලබන ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත සඳහන් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වැය කරනු ලබන විදේශ විනිමය ඉතිරි කර ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අංශයේ ලිපි ගනුදෙනුවලදී නවීන තාක්ෂණය භාවිතා නොකිරීමට හේතු කවරේද;

(ii) නවීන තාක්ෂණය භාවිතා කිරීමට බාධාවන චක්‍රලේඛ හා රෙගුලාසි තිබේ නම්, ඒවා සංශෝධනය කිරීම සඳහා පියවර නොගැනීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3155/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සෘජු අධීක්ෂණය යටතේ ඇති කාර්මික විද්‍යාල සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් කාර්මික විද්‍යාලය/වෘත්ති පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇති ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කාර්මික විද්‍යාලවල/වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල සේවය කරනු ලබන අධ්‍යයන හා අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශීය හා විදේශ රැකියා ඉලක්ක කර ගනිමින් ඉහත සඳහන් ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පුහුණු පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2015 වසරේ සිට මේ දක්වා දේශීය හා විදේශීය රැකියා සඳහා යොමු කර ඇති පුහුණුලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් පාඨමාලා යාවත්කාලීන කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3166/2022

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් ලබා දීමට එකඟ වී සිටි ජාත්‍යන්තර මූල්‍ය ආයතනයේ නම කවරේද;

(iii) මේ වනවිට එම ව්‍යාපෘතියේ වැඩකටයුතු නතර වී ඇති බව දන්නේද;

(iv) එම ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3170/2022

ගරු මයන්ත දිසානායක මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රක්ෂිත වනාන්තර අනවසරයෙන් එළිපෙහෙලි කරනු ලබන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට අනවසර එළිපෙහෙලි කිරීම් සිදුකර ඇති රක්ෂිත වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(iii) රක්ෂිත වනාන්තර අනවසරයෙන් එළිපෙහෙලි කරනු ලැබූ පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3207/2022

ගරු මිලාන් ජයතිලක මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් සමාජ සවිබලගැන්වීමේ වැඩසටහනට දායක කර ගෙන ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි සංවර්ධන අරමුදල් ආයෝජනය කර තිබේද;

(ii) එසේ නම්, එසේ ආයෝජනය කර ඇති ආයතනවල නම් කවරේද;

(iii) එම ආයෝජන වෙනුවෙන් ලැබූ ප්‍රතිලාභ ප්‍රතිශතාත්මකව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3217/2022

ගරු සුදත් මංජුල මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පොදු කටයුතු වෙනුවෙන් භාවිතා කිරීම සඳහා ඉදිකිරීම් ආරම්භ කරන ලද, එහෙත් වැඩ අවසන් නොකළ ගොඩනැගිලි ශ්‍රී ලංකාවේ පවතින බව දන්නේද;

(ii) එම ගොඩනැගිලි සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කර තිබේද;

(iii) එම ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3232/2022

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් 2015 වර්ෂයේ සිට පළාත් පාලන ආයතනවලට අනියම් පදනම මත කම්කරුවන් විශාල සංඛ්‍යාවක් බඳවාගන්නා ලද බව දන්නේද;

(ii) එසේ නම්, එම කම්කරුවන් අතරින් මේ දක්වා සේවය කරනු ලබන කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කම්කරුවන් මේ වනතෙක් ස්ථිර කර නොමැති බව දන්නේද;

(iv) ඔවුන් සේවයේ ස්ථිර කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3261/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බේරුවල සිට හික්කඩුව දක්වා වූ වෙරළ තීරය සීඝ්‍ර මුහුදු ඛාදනයට ලක් වන බවත්;

(ii) ඒ හේතුවෙන් ධීවරයන් දැඩි අර්බුදයකට මුහුණ දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වෙරළ තීරය සංරක්ෂණය කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම සංරක්ෂණ කටයුතු ආරම්භ කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 16 දිනැති අංක 2297/79 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.18 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 23 දිනැති අංක 2298/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.18 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2022 නොවැම්බර් 09 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

6/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බොර තෙල් නොමැති වීම හේතුවෙන් වර්ෂ 2021 නොවැම්බර් මාසයෙන් පසු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ, සපුගස්කන්ද පිරිපහදුවේ නිෂ්පාදන කටයුතු නවතා දමන ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) ලෝක වෙළඳපළේ බොර තෙල් හිඟයක් නොමැති අවස්ථාවක, බොර තෙල් වෙනුවට පිරිපහදු කරන ලද ඉන්ධන ආනයනය කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පියවර ගැනීමට හේතු කවරේද;

(iii) බොර තෙල් වෙනුවට පිරිපහදු කරන ලද ඉන්ධන ආනයනය කිරීම මඟින් සංස්ථාව ලාභ ලබා තිබේද;

(iv) එසේ නම්, එම ලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

32/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් පෞද්ගලික අංශයේ මූල්‍ය ආයතන දැඩි අර්බුදකාරී තත්ත්වයකට පත්ව ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් පෞද්ගලික අංශයේ මූල්‍ය ආයතන බුන්වත් විය හැකි බවත්;

(iii) එවැනි තත්ත්වයකදී, එම ආයතනවල තැන්පත්කරුවන්ගේ මුදල් අනාරක්ෂිත විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික අංශයේ මූල්‍ය ආයතනවල තැන්පත්කරුවන්ගේ මුදල්වල සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් රජයට වගකීම භාරගත හැකිද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iii) පෞද්ගලික අංශයේ මූල්‍ය ආයතනයක් ඇවර කරන්නේ නම්, එම ආයතනයේ තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ලබා දෙනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

299/2022

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට, උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිටිගොඩ, දේවහන්දිය, හා දඹගහපිටිය යන ප්‍රදේශවලට සහ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට බලපා ඇති වන අලි තර්ජනය හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත්වන ජනතාවට හා ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතුවලට දැඩි බලපෑමක් එල්ල වී ඇති බවත්;

(ii) වන සතුන් විසින් සිදු කරනු ලබන වගා හානිය, මහනුවර දිස්ත්‍රික්කයේ සැලකිය යුතු ගැටලුවක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශවල පවතින වන අලි තර්ජනය වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) වන අලින් විසින් සිදු කරනු ලබන හානි හේතුවෙන් පීඩාවට පත් වී ඇතිපුද්ගලයන්ට වන්දි ලබා දීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් පවතින්නේද;

(iii) එසේ නම්, ඒ යටතේ මේ වනවිට ලබා දී ඇති සහන කවරේද;

(iv) වන සත්ව හානි හේතුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව ආවේණික භෝග වගා කිරීමෙන් ඉවත් වී ඇති බව දන්නේද;

(v) එසේ නම්, එම තත්ත්වය මගහරවා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

346/2022

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් පෞද්ගලික බවුසර් රථ හිමියන්ගේ සංගමයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය හා ඔහුට අයත් බවුසර් රථයේ අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්ධන මිල ඉහළ යෑමට සාපේක්ෂව ප්‍රවාහන ගාස්තු සංශෝධනය නොකිරීම හේතුවෙන් ඉහත සංගමයේ සාමාජිකයන් දුෂ්කරතාවලට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

679/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, දිඹුලාගල අධ්‍යාපන කලාපයේ, දම්මින්න මහා විද්‍යාලය නමින් විද්‍යාලයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම විද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව හා සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැසි දිනවලදී එම පාසලේ පංති කාමර තෙමෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම විදුහල සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

968/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගණකාධිකාරිවරයකු පත් කර තිබේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගණකාධිකාරිවරයකු පත් කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු, කලවාන්චිකුඩි සහ පෝරතිවුපත්තු යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනෙහි ජනගහනය අධික බැවින් එම එක් එක් කොට්ඨාසය කොටස් දෙකකට බෙදීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1110/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "යහපාලන රජය" සමයේ මිලේනියම් චැලේන්ජ් කෝපරේෂන් (MCC) ගිවිසුම අත්සන් කිරීමට නියමිතව තිබූ බව දන්නේද;

(ii) එම ගිවිසුම මඟින් ශ්‍රී ලංකාවට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිලාභ කවරේද;

(iii) එම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් මූලිකත්වය ගන්නා ලද දේශපාලනඥයන්ගේ නම් හා පරිපාලන නිලධාරින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත ගිවිසුම අත්සන් නොකිරීම සඳහා බලපාන ලද හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3266/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව;

(ii) ඒ අතරින් මේ වනවිට වැඩ නිම කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාලය තුළදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව;

(ii) ඒ අතරින් මේ වනවිට වැඩ නිම කර ඇති හා වැඩ නතර කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 නොවැම්බර් 11 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2536/2022

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා චකුගඩු අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදුවිය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2555/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2568/2022

ගරු සංජීව එදිරිමාන්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගර්භනී මව්වරුන් හා ළදරුවන් සඳහා අවශ්‍ය ත්‍රිපෝෂ මේ වනවිට නිකුත් කරනු ලබන්නේද;

(ii) කපුවත්ත, ජා-ඇල ස්ථාපිත කර ඇති ත්‍රිපෝෂ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව සිදු කරන්නේද;

(iii) ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය දේශීය වශයෙන් සපයා ගනු ලබන්නේද ;

(iv) නොඑසේ නම්, ආනයනය කරන්නේද;

(v) ආනයනය කරන්නේ නම්, වර්ෂ 2015 සිට මේ දක්වා ආනයනය කර ඇති අමුද්‍රව්‍ය ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2591/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ, නැගෙනහිර ප්‍රාදේශිකයේ, ප්‍රධාන ප්‍රාදේශීය කාර්යාලය කල්මුණේ ප්‍රදේශයේ ගොඩනැගිල්ලක කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන බවත්;

(ii) එම කාර්යාලය ස්ථාපිත කිරීමට සුදුසු ඉඩමක් මඩකලපුව ප්‍රදේශයෙන් වෙන්කර දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i)හි සඳහන් ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගන්නා ලද වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය කවරේද;

(iii) ගොඩනැගිල්ලෙහි මාසික කුලී මුදල සහ එය කුලී පදනම මත ලබා ගන්නා ලද දින සිට මේ දක්වා ගෙවන ලද මුළු කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) (ii)හි සඳහන් ඉඩම, ඉහත සඳහන් කාර්යය සඳහා වෙන් කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ඉඩමේ අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම ප්‍රමාදවීමට හේතු වූ කරුණු කවරේද;

(iii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කවරේද;

(iv) මෙම කාර්යාලය ස්ථාපිත කිරීමේදී, මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2605/2022

ගරු අශෝක් අබේසිංහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටත්විජිතභාවයෙන් නිදහස් වීමෙන් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සෘණ අගයක් වාර්තා කරන ලද වර්ෂ කවරේද;

(ii) එම එක් එක් වර්ෂයේ ආර්ථික වර්ධනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් වර්ෂයේ මුදල් අමාත්‍ය ධුරයේ සහ ජනාධිපති ධුරයේ කටයුතු කරන ලද පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත සඳහන් වර්ෂවල ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට එවකට පැවති රජයන් විසින් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2625/2022

ගරු ඩී. වීරසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින පිරිවෙන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිවෙන්වල අධ්‍යාපනය ලබන ගිහි සහ පැවිදි සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පිරිවෙන්වල සේවය කරනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පිරිවෙන්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2022 වර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදනය කොපමණද;

(ii) නව පිරිවෙන් ආරම්භ කිරීම සඳහා සැලසුම් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2633/2022

ගරු සම්පත් අතුකෝරළ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යල සහ මහ කන්න සඳහා අවශ්‍ය පොහොර ඉදිරියේදී අඛණ්ඩව සැපයීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) බීජ වී හිඟයකින් තොරව ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) විවිධ මිල ගණන් යටතේ මේ වනවිට බීජ වී අලෙවි කරනු ලබන බව දන්නේද;

(iv) බීජ වී මිල පාලනය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විවිධ මිල ගණන් යටතේ වල් නාශක හා පළිබෝධ නාශක අලෙවි කරනු ලබන බව දන්නේද;

(ii) වල් නාශක හා පළිබෝධ නාශක මිල පාලනය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(iii) ඒවා සහන මිලට ලබා දීම සඳහා මේ වනවිට රජය මැදිහත් වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2641/2022

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කර්මාන්තශාලාවලින් සහ වෙනත් ඉදිකිරීම්වලින් බහුල වශයෙන් ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන බවත්;

(ii) සමහර ඉදිකිරීම් සඳහා නිසි අධ්‍යනයකින් තොරව පරිසර බලපත්‍ර නිකුත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන කර්මාන්තශාලා/ආයතන දැනුම්වත් කර එලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීමට පියවර ගන්නේද;

(ii) ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන බවට මේ වනවිට හඳුනාගෙන ඇති කර්මාන්තශාලා/ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම කර්මාන්තශාලා/ආයතනවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2646/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දශක කිහිපයකට ඉහත ශ්‍රී ලංකාවේ මිනිස් ජනාවාස සහ වගාබිම් බවට පත්ව තිබූ භූමි, පසු කාලීනව රක්ෂිත වනාන්තර බවට පත් කර ගැසට් කර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත් වූ ජනතාව පීඩාවට පත් වී ඇති බවත්;

(iii) එම ජනතාවගේ ගැටලු සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම පිණිස ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත (i) හි සඳහන් ගැසට් කිරීම හේතුවෙන් මේ වනවිට වාර්තා වී ඇති ගැටලු සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගැටලු විසඳීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) ඉදිරියේදී එවැනි ගැටලු ඇති නොවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2887/2022

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කල්පිටිය අර්ධද්වීපයේ දෙළුම් වගා කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, එහි දෙළුම් වගා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(iii) කල්පිටිය අර්ධද්වීපයේ දෙළුම් වගා කරනු ලබන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ගොවීන්ට නිසි පරිදි තාක්ෂණික දැනුම නොලැබීම හා නිෂ්පාදන අලෙවි කර ගැනීමේ බාධා පවතින බව දන්නේද;

(v) ඒවා විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.36/2022

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා,— වගා හානි සිදු කරන රිලවුන් ගහනය පාලනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික බෝගවලට වන සතුන්ගෙන් විශාල හානි සිදුවන හෙයින් ද, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ වාර්තා අනුව වන සතුන් හේතුවෙන් සිදුවන වගා හානිය වාර්ෂිකව 40% ක් පමණ එනම්, රුපියල් කෝටි 1800 ඉක්මවන හෙයින් ද, මේ අතරින් රිලවුන්ගෙන් කෘෂි වගාවන්ට සිදුවන හානි ක්‍රමයෙන් වර්ධනය වීම හේතුවෙන් මෙරට ගොවි ජනතාවට මෙන්ම රටේ ජාතික ආර්ථිකයට සෘජුවම බලපෑම් සිදුවන හෙයින් ද, ශ්‍රී ලංකාව බෞද්ධ මෙන්ම අවිහිංසාවාදී සංස්කෘතියකින් හෙබි රටක් වශයෙන් රිලවුන් විනාශ කිරීම මඟින් මෙම ගැටලුව විසඳීම අනුමත කළ නොහැකි හෙයින් ද, විද්‍යාත්මක ක්‍රමවේදයක් මඟින් රිලවුන් ගහනය පාලනය කිරීම සඳහා යෝග්‍ය වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.